සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## විද්‍යාව - I

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ප්‍රභාසංශ්ලේෂණය සිදුකරන ජීවියෙකු වන්නේ,
    1. සමනලයා 2. බිම්මල 3. මිරිස් පැළෑටිය 4. මුහුදු මල

02. සංචරණය සඳහා වරල් භාවිත කරන සතෙකි,
    1. ඉබ්බා 2. බලයා 3. ගිරවා 4. නයා

03. ස්කන්ධයක් සහිත දෙයක් වන්නේ,
    1. වාතය 2. විදුලිය 3. ආලෝකය 4. ශබ්දය

04. දමා ඇති භාජනයේ හැඩය අනුව, හැඩය වෙනස් වන ද්‍රව්‍යයකි,
    1. ජලය 2. බිස්කට් 3. මකන කෑලි 4. පැන්සල

05. ජලයේ වායු අවස්ථාවක් සඳහා උදාහරණයකි,
    1. අයිස් 2. හුමාලය 3. හිම 4. මුහුද

06. වැඩිම ලවණ ප්‍රමාණයක් දියවී ඇති ජලය අඩංගු වන ස්ථානයක් වන්නේ,
    1. ළිඳ 2. කලපුව 3. ගංගාව 4. සාගරය

07. ජෛව ස්කන්ධ හා පොසිල ඉන්ධන යන කාණ්ඩ දෙකටම අයත් ඉන්ධනයකි,
    1. ගල් අඟුරු 2. පොල්කටු 3. ඩීසල් 4. ලී කුඩු


08. පහත ඒවා අතරින් ප්‍රබලතම ශක්ති ප්‍රභවය කුමක් ද?
    1. ජෛව ස්කන්ධ 2. පොසිල ඉන්ධන 3. සුළඟ 4. සූර්යයා

09. රූපයේ දක්වා ඇති උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් සුදුසු පොසිල ඉන්ධනය වන්නේ,
    1. ගල් අඟුරු
    2. භූමිතෙල්
    3. (ද්‍රව) පෙට්‍රෝලියම් වායුව
    4. ඩීසල්




10. ස්වාභාවික ආලෝක ප්‍රභවයකි,
    1. ඉටිපන්දම 2. හඳ 3. කනාමැදිරියා 4. විදුලි බුබුල

11. මෙම රූපයේ දක්වා ඇති ආකාරයට තෙල් කඩදාසි තුළින් ඉටිපන්දම දෙස බැලූ විට,




1. ආලෝකයත්, දැල්ලත් හොඳින් පෙනේ.
2. ආලෝකය දැකිය හැකි වුවද, දැල්ල පැහැදිලිව නොපෙනේ.
3. ආලෝකය හා දැල්ල යන දෙකම නොපෙනේ.
4. දැල්ල පැහැදිලිව පෙනුනත් ආලෝකය නොපෙනේ.

12. කෘත්‍රිම ශබ්දයක් නිකුත් වන්නේ,

1. බල්ලෙක් බුරන විට
2. සුළං හැමීමේ දී
3. පාසල් සීනුව නාද වීමේ දී
4. විදුලි කෙටීමේ දී

13. සංගීත නාදයක් ඇතිවන අවස්ථාව වන්නේ,

1. යන්ත්‍රයකින් තණකොළ කැපීමේ දී
2. වාහනයක් ධාවනයේ දී
3. කුරුල්ලන්ගේ නාදය
4. වයලීනයක් වාදනය කිරීමේ දී

14. ශ්‍රී ලංකාවේ ජල විදුලි බලාගාරයක් පිහිටා ඇති ප්‍රදේශයකි,

1. කැලණිය
2. කොත්මලේ
3. හම්බන්තොට
4. නොරොච්චෝලේ

15. භාවිතයේ දී ඒවා තුළ අඩංගු රසායන ද්‍රව්‍ය ක්‍රමයෙන් අවසන් වන රසායනික කෝෂ හඳුන්වන්නේ,

1. ප්‍රාථමික කෝෂ ලෙස ය
2. ද්විතියික කෝෂ ලෙස ය
3. සූර්ය කෝෂ ලෙස ය
4. සරල කෝෂ ලෙස ය

16. ආලෝකය පතිත වීමත් සමඟ ආලෝක සංවේදී ප්‍රතිරෝධකයක ප්‍රතිරෝධය,

1. වැඩි වේ.
2. අඩු වේ.
3. වෙනස් නොවේ
4. එය සම්බන්ධ කර ඇති පරිපථය අනුව තීරණය වේ.

17. උණුසුම් තේ කෝප්පයක් සාමාන්‍ය පරිසරයෙහි තබා ඇති විට



1. පරිසරයෙන් තාපය උරාගෙන, උෂ්ණත්වය අඩුවේ.
2. පරිසරයට තාපය පිටකිරීම මගින් උෂ්ණත්වය වැඩිවේ.
3. පරිසරයට තාපය පිට කරමින් උෂ්ණත්වය අඩුවේ.
4. උෂ්ණත්වය අඩු වුවද තාප හුවමාරුවක් සිදු නොවේ.

18. එක්තරා ආහාර දාමයක මුල් පුරුක් දෙක පහත දැක්වේ.

ශාක → x

මේ මත **පමණක් පදනම්** ව එළඹිය හැකි නිගමනය වන්නේ, x

1. අනිවාර්යයෙන් ම ශාක භක්ෂකයෙකි
2. අනිවාර්යයෙන් ම මාංශ භක්ෂකයෙකි
3. අනිවාර්යයෙන් ම සර්ව භක්ෂකයෙකි
4. කිසිසේත්ම මාංශ භක්ෂකයෙක් විය නොහැක.

19. සුළඟේ දිශාව මැනීමට භාවිත කරන උපකරණය වන්නේ,

1. සුළං දිශා දර්ශකය
2. අනිල මානය
3. ආර්ද්‍රතාමානය
4. උෂ්ණත්වමානය

20. හය ශ්‍රේණියේ සිසුන් ඉතා ක්‍රියාශීලීය. ඉක්මණින් ශරීරය වර්ධනය වේ. එබැවින් 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්,

1. සීනි බහුල ආහාර වැඩිපුර ලබාගත යුතුය.
2. පිටි බහුල ආහාර වැඩිපුර ලබාගත යුතුය.
3. ප්‍රෝටීන් බහුල ආහාර භාවිතය වැඩිකළ යුතුය.
4. සමබල ආහාර වේලක් ප්‍රමාණවත් තරමින් ලබාගත යුතුය.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP


## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## විද්‍යාව - II

නම / විභාග අංකය:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු ලියන්න.

01. A i. ශාක තම පෝෂණ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ප්‍රභාසංශ්ලේෂණය සිදු කරයි. මෙම ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ශක්තිය මෙන්ම ද්‍රව්‍යය (පදාර්ථ) පරිසරයෙන් ලබා ගනී. එසේම පරිසරයට ද්‍රව්‍ය මුදාහරී. මෙම තොරතුරු සැලකිල්ලට ගනිමින් පහත තීරු දෙක ගලපා යා කරන්න.




| A තීරුව | B තීරුව | |
|---|---|---|
| a. ශාකයට ශක්තිය සපයන ප්‍රභවය | ඔක්සිජන් | |
| b. ශාකය ලබාගන්නා ශක්ති ආකාරය | ජලය | |
| c. ශාකය පසෙන් උරා ගනී | සූර්යයා | |
| d. පරිසරයට මුදා හරින වායුවකි | කාබන්ඩයොක්සයිඩ් | |
| e. වායුගෝලයෙන් අවශෝෂණය කර ගනී | ආලෝකය | (ලකුණු 05) |

ii. මෙම ශාකය වැඩෙන පරිසරය කුමක් ද? (ලකුණු 01)

iii. ශාක පත්‍ර කොළ පැහැයෙන් යුක්තවීමට හේතුව කුමක් ද? (ලකුණු 01)

iv. ශාකයක වර්ධනය, සතෙකුගේ වර්ධනයෙන් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 01)

v. පදාර්ථය, ශක්තියෙන් වෙනස්වන ලක්ෂණයක් ලියන්න. (ලකුණු 01)

B විද්‍යාව විෂයයෙහි එන ඇතැම් කරුණු පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවල නිරතවීම ඉතා වැදගත් වේ.

i. ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා තෝරා ගත හැකි ජලාශ්‍රිත නොවන ස්ථානයක් සඳහන් කරන්න. (ලකුණු 01)

ii. ක්ෂේත්‍ර චාරිකාවක නිරතවීමේ දී ඔබ රැගෙන යායුතු දෙයක් නම් කරන්න. (ලකුණු 01)

iii. මිරිදිය ජලාශයක් ආශ්‍රිත ක්ෂේත්‍ර චාරිකාවක දී තම ආරක්ෂාව පිණිස අනුගමනය කළ යුතු කරුණක් ලියන්න. (ලකුණු 01)


iv. කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ඔබ ලබන කුසලතා දෙකක් ලියන්න. (ලකුණු 02)

v. විද්‍යාව ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකු ලෙස, පරිසරයේ යහපැවැත්ම උදෙසා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 16)

02. A අප අවට ඇති දෑ සැලකිල්ලට ගනිමින් ගොඩනගන ලද සංකල්ප සිතියමක් පහත දැක්වේ.
කොටුව තුළ දී ඇති වචන සුදුසු ස්ථානවලට ආදේශ කරමින් සංකල්ප සිතියමේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඝන, | ශබ්දය, | ආහාර පිසීම, | පෑන, | ශක්තිය, | වායු, | පදාර්ථය |




(ලකුණු 07)

B පරිසර හිතකාමී ශක්ති ප්‍රභේදයක් භාවිතයෙන් ක්‍රියාත්මක වන උපකරණයක් පහත රූපයෙන් දැක්වේ.


i. මෙම උපකරණයේ නම කුමක් ද?
(ලකුණු 01)

ii. මෙම උපකරණය ක්‍රියාත්මක වීමට අවශ්‍ය ශක්ති ආකාරය කුමක් ද? (ලකුණු 01)

iii. මෙමඟින් ලබාගත හැකි ප්‍රයෝජනයක් ලියන්න.
(ලකුණු 01)


iv. ඉහත දැක්වෙන උපකරණය භාවිතයේ වාසියක් ලියා දක්වන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 11 යි)



03. A පෘථිවියේ ධ්‍රැවාසන්න ප්‍රදේශයක දී ලබාගත් ඡායාරූපයක් පහත දැක්වේ. ග්ලැසියර් ද්‍රවවීමේ තර්ජනයට මුහුණ දෙන හිම වලස් මව හා පැටවා මෙන්ම, වළාකුළින් බර අහස ද එහි දැක්වේ.

මෙහි A, B හා C යන ස්ථානවල ඇති ජලය පවතින භෞතික අවස්ථා හා එම අවස්ථා සඳහා උදාහරණ එක බැගින් ලියා වගුව සම්පූර්ණ කරන්න.




| ස්ථානය | ජලය පවතින අවස්ථාව | උදාහරණ |
|---|---|---|
| A | ඝන | i. ................................................................ |
| B | ii. ................................ | iii. ................................................................ |
| C | iv. ................................ | v. ................................................................ |

(ලකුණු 05)

vi. ග්ලැසියර් ද්‍රවවීම නිසා එම පරිසරවල ජීවත්වන සතුන් මුහුණ දෙන ගැටළුවක් ලියන්න. (ලකුණු 01)

B ආලෝකය යනු මිනිසාට, අනෙකුත් සතුන්ට මෙන්ම ශාකවලට ද නැතිවම බැරි ශක්ති ප්‍රභේදයකි.

i. පෙනීම සඳහා අවශ්‍යවන සාධකයක් ලියන්න. (ලකුණු 01)

ii. ආලෝක කදම්භයක් ඇඳ දක්වන්න. (ලකුණු 01)

iii. සංඥා ලබාදීම සඳහා ආලෝකය යොදා ගන්නා අවස්ථාවක් ලියා දක්වන්න. (ලකුණු 01)

iv. විදුලියෙන් ආලෝකය නිපදවන උපකරණයක් නම් කරන්න. (ලකුණු 01)

v. තමන්ගේත්, මාර්ගයේ ගමන් ගන්නා අන් අයගේත් ආරක්ෂාව වෙනුවෙන් රියදුරන්ට ආලෝකය භාවිත කළහැකි ආකාරයක් ලියා දක්වන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 11යි)

04. A පාපැදියක භාවිතවන ධ්වනි ප්‍රභවයක් මෙම රූපයෙන් දැක්වේ.



i. මෙම උපකරණය නම් කරන්න. (ලකුණු 01)

ii. නාද වෙමින් පවතින අවස්ථාවක මෙය මත ඇඟිල්ල තැබූ විට දැනෙන සංවේදනය කුමක් ද? (ලකුණු 01)

iii. පාපැදි කරුවෙකුට මෙම උපකරණය වැදගත් වන්නේ කෙසේද? (ලකුණු 01)

iv. කන් පෙත්තෙහි කාර්යය කුමක් ද? (ලකුණු 01)


v. කරදරකාරී සතුන් පලවා හැරීමට ශබ්දය යොදාගන්නා අවස්ථාවක් ලියන්න. (ලකුණු 01)

vi. රූපවාහිනිය, රේඩියෝව, ශබ්ද විකාශක, වාහන නළා ආදිය භාවිතයේ දී අප සැලකිලිමත් වියයුතු කරුණක් ලියන්න. (ලකුණු 02)

B එදිනෙදා ජීවිතයේ දී අප භාවිත කරන බොහෝ උපකරණවල චුම්බක අඩංගු වේ.

i. චුම්බක සහිත උපකරණයක් නම් කරන්න. (ලකුණු 01)

ii.




රූපයෙන් දැක්වෙන පරිදි චුම්බකයක් සෘජුෆෝම් කැබැල්ලක් මත තබා ජලයේ පාවීමට සලස්වා ඇත. විවිධ දිශා ඔස්සේ එහි ධ්‍රැව සිටින සේ පා කිරීමට උත්සාහ කෙරිණි.


a. මෙහිදී ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 01)

b. මෙහි යොදාගෙන ඇති චුම්බකයේ නම කුමක් ද? (ලකුණු 01)

iii. මෙහි 'S' ලෙස සටහන් කර ඇති කෙළවර දෙසට තවත් චුම්බකයක දක්ෂිණ ධ්‍රැවයක් ළං කළහොත් ඇතිවන තත්ත්වය කුමක් ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11යි)

05. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දිනපතා කාලගුණය පිළිබඳ වාර්තා තබා ගනී. කුරුණෑගල නගරයේ එක් එක් මාසයේ සාමාන්‍ය වර්ෂාපතනය පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.




i. කුරුණෑගල නගරයට වැඩිම වර්ෂාපතනය හා අඩුම වර්ෂාපතනය ලැබුණු මාස වෙන වෙනම ලියන්න. (ලකුණු 02)

ii. එම නගරයට ලැබුණු වැඩිම වර්ෂාපතනය කොපමණ ද? (ලකුණු 01)

iii. වර්ෂාපතනය මැනීමට භාවිත කරන උපකරණය කුමක් ද? (ලකුණු 01)

iv. වර්ෂාපතනය ප්‍රකාශ කිරීමට භාවිත කර ඇති ඒකකය ලියන්න. (ලකුණු 01)


v. කාලගුණය හා දේශගුණය යන්න සරලව හඳුන්වන්න. (ලකුණු 02)

vi. කාලගුණය පිළිබඳ තොරතුරු සෙවීමේ දී බහුලව භාවිත කරන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

vii. කාලගුණ විපර්යාස ආශ්‍රිත ස්වාභාවික ආපදා දෙකක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 11යි)

06. ගෙවත්තේ දක්නට ලැබෙන ආහාර සම්බන්ධතා සමූහයක් රූපයෙන් පෙන්වා ඇත.




i. ඉහත රූප සටහනෙන් පෙන්වා ඇත්තේ කුමක් ද? (ලකුණු 01)

ii. එහි සිටින ශාක භක්ෂකයෙක්, සර්ව භක්ෂකයෙක් හා මාංශ භක්ෂකයෙක් ලියා දක්වන්න. (ලකුණු 03)

iii. ඉහත රූප සටහන ඇසුරින් පුරුක් 04කින් සමන්විත ආහාර දාමයක් ගොඩනගන්න. (ලකුණු 02)

iv. ඉහත සතුන් අතරින් කටුස්සා තම ආරක්ෂාව පිළිබඳ සැලකීමේ දී සුවිශේෂී ලක්ෂණ දරණ සත්ත්වයෙකි. කටුස්සා සතු එම ලක්ෂණය කුමක් ද? (ලකුණු 01)

v. හරිත ශාක නිෂ්පාදකයා ලෙස හැඳින්වීමට හේතුව ලියන්න. (ලකුණු 01)

vi. නාගයින් මැරීම නිසා පරිසරයට සිදුවන හානියක් සඳහන් කරන්න. (ලකුණු 01)

vii. සමහර මාංශ භක්ෂක සතුන් මිනිස් ඇසුරේ ජීවත්වීම නිසා සර්ව භක්ෂක පෝෂණ ක්‍රමයකට හැඩගැසී තිබේ. එවැනි සතුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 11යි)

07. A ස්විචයක්, වියළි කෝෂයක්, ඇමීටරයක්, බල්බයක් හා සම්බන්ධක කම්බි ඔබට දී ඇත.

i. ඉහත උපාංග භාවිත කර සැකසිය හැකි සරල පරිපථයක රූප සටහනක් සම්මත සංකේත භාවිත කොට අඳින්න. (ලකුණු 02)

ii. විදුලිය ගලායන ද්‍රව්‍ය හඳුන්වන්නේ කෙසේ ද? ඒ සඳහා උදාහරණයක් දෙන්න. (ලකුණු 02)


iii. a. ඩයෝඩයක ප්‍රධාන කාර්යය කුමක් ද? (ලකුණු 01)

b. ආලෝක විමෝචක ඩයෝඩයක සම්මත සංකේතය අඳින්න. (ලකුණු 01)

iv. විදුලි ශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කිරීමට කාලය එළඹ ඇත. ඒ සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න. (ලකුණු 01)

v. වර්තමානයේ විදුලි සැර වැදීම නිසා සිදුවන අනතුරු බහුලව සිදුවේ. විදුලි අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් ලියන්න. (ලකුණු 01)

B i. වායු ප්‍රසාරණය පෙන්වීම සඳහා සැකසූ ඇටවුමක් පහත දැක්වේ. වායු ප්‍රසාරණය සිදුවන බව ඔබ හඳුනා ගන්නේ කෙසේ ද? (ලකුණු 01)




ii. තාපය නිසා ඇතිවන පාරිසරික බලපෑම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 11යි)


Download Term Test Papers, Short Notes From One Place!

(8) WWW.PastPapers.WiKi (8)

(8) WWW.PastPapers.WiKi (8)
Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

# විද්‍යාව

## පිළිතුරු පත්‍රය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 01. | 3 |
| 02. | 2 |
| 03. | 1 |
| 04. | 1 |
| 05. | 2 |
| 06. | 4 |
| 07. | 1 |
| 08. | 4 |
| 09. | 3 |
| 10. | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 11. | 2 |
| 12. | 3 |
| 13. | 4 |
| 14. | 2 |
| 15. | 1 |
| 16. | 2 |
| 17. | 3 |
| 18. | 4 |
| 19. | 1 |
| 20. | 4 |

### II කොටස

- සැලකිය යුතුයි: මෙහි ඇතැම් පිළිතුරු සඳහා ලබා දී ඇත්තේ ආදර්ශ පමණි. ඒ හා සමාන හෝ නිවැරදි වෙනත් පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

01. A i. a - සූර්යයා b - ආලෝකය c - ජලය d - ඔක්සිජන් e - කාබන්ඩයොක්සයිඩ් (ලකුණු 05)
ii. භෞමික පරිසරය (ලකුණු 01)
iii. හරිතප්‍රද අඩංගු වීම (ලකුණු 01)
iv. ශාකයේ වර්ධනය අසීමිතවීම (ලකුණු 01)
v. ස්කන්ධයක් තිබීම, අවකාශයේ ඉඩක් ගැනීම (ලකුණු 01)


B i. වනාන්තරයක් / තෘණ බිමක් / කර්මාන්ත ශාලාවක් / වගා බිමක් ආදී ගැලපෙන පිළිතුරකට (ලකුණු 01)
ii. සටහන් පොතක් / පෑනක් / කුඩයක් / වතුර බෝතලයක් යනාදි ය (ලකුණු 01)
iii. ජලයට බැසීමෙන් වැළකී සිටීම ආදී ගැලපෙන පිළිතුරකට (ලකුණු 01)
iv. කණ්ඩායම් සහයෝගිතාව, අන් අදහස්වලට ගරු කිරීම, ඉවසීම, දැනුම හුවමාරු කර ගැනීම යනාදිය (ලකුණු 02)
v. ගස්/පැළ සිටුවීම, පරිසරයට අපද්‍රව්‍ය නොදැමීම, ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම, පොලිතීන් ප්ලාස්ටික් යනාදිය පිළිස්සීමෙන් වැළකී සිටීම, ද්‍රව්‍ය භාවිතය අවම කිරීම, ශාක හා සතුන්ට හානි නොකිරීම, හැකි දෑ ප්‍රතිචක්‍රීකරණය කිරීම. (ලකුණු 02)

(මුළු ලකුණු 16)

(2) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

02. A i. ශක්තිය ii. ආහාර පිසීම iii. ශබ්දය iv. පැන v. සන vi. පදාර්ථය vii. වායු (ලකුණු 07)
B i. සූර්ය (තාප) උඳුන (ලකුණු 01) ii. සූර්ය තාපය (ලකුණු 01)
iii. ආහාර පිසීම / ජලය උණු කිරීම (ලකුණු 01)
iv. ● පරිසරයට හානි කර දෑ එකතු නොවීම ● සූර්ය තාපය නොමිලයේ ලැබීම
● භාවිතය සඳහා මුදල් වැය නොවීම (ලකුණු 01)
(මුළු ලකුණු 11)

03. A i. ග්ලැසියර්/හිම/අයිස් (ලකුණු 01) ii. ද්‍රව (ලකුණු 01)
iii. ගංගා/ළිං/සාගර/මුහුද (ලකුණු 01) iv. වායු (ලකුණු 01)
v. හුමාලය/ජලවාෂ්ප (ලකුණු 01) vi. තම වාසස්ථාන අහිමිවීම (ලකුණු 01)

B i. ● (නීරෝගි) ඇසක් ● ආලෝකය (ලකුණු 01)
ii. 
(ලකුණු 01)
iii. ප්‍රදීපාගාරය, මාර්ග ආලෝක සංඥා, වාහනවල සංඥා පහන් (ලකුණු 01)
iv. විදුලි බුබුල, LED (ලකුණු 01)
v. ● නියමිත අවස්ථාවල දී සංඥා පහන් දැල්වීම ● රාත්‍රියේ පහන් දල්වාගෙන ධාවනය කිරීම
● රාත්‍රියේ දී අවශ්‍ය අවස්ථාවල විදුලි පහන් ඩිම් කිරීම (ලකුණු 01)
(මුළු ලකුණු 11)

04. A i. සීනුව (ලකුණු 01) ii. ඇඟිල්ලට කම්පනයක් දැනීම (ලකුණු 01)
iii. අනතුරක් වළක්වා ගැනීම සඳහා (ලකුණු 01) iv. ශබ්දය කන තුළට යොමු කිරීම (ලකුණු 01)
v. ටකය ශබ්ද කිරීම, දිය හොල්මන භාවිතය, කෑ ගසා සතුන් එලවීම (ලකුණු 01)
vi. අන් අයට කරදරයක් /බාධාවක් නොවන පරිදි එය භාවිතය (ලකුණු 02)
B i. චෙස් පුවරුව, විදුලි මෝටරය, ශීතකරණ දොර, පැන්සල් පෙට්ටි (ලකුණු 01)
ii. a. සෑම විටම උතුරු - දකුණු දිශා ඔස්සේ එය නිශ්චලතාවයට පත්වේ. (ලකුණු 01)
b. දණ්ඩ චුම්බකය (ලකුණු -01)
iii. පාවෙන චුම්බකය ඇත්වේ / විකර්ෂණය වේ. (ලකුණු 01)
(මුළු ලකුණු 11)

05. i. වැඩිම වර්ෂාපතනය - - ඔක්තෝබර් අඩුම වර්ෂාපතනය - පෙබරවාරි (ලකුණු 02)
ii. 400 mm (ලකුණු 01) iii. වර්ෂාමානය (ලකුණු 01) iv. මිලිමීටර් (ලකුණු 01)
v. හඳුන්වාදීමට (ලකුණු 02) vi. වර්ෂාපතනය, උෂ්ණත්වය, ආර්ද්‍රතාව, සුළගේ වේගය හා දිශාව (ලකුණු 02)
vii. සුළි සුළං, ගංවතුර, නියගය, නායයාම (ලකුණු 02)
(මුළු ලකුණු 11යි)

06. i. ආහාර ජාලයක් (ලකුණු 01)
ii. දළඹුවා, ගිරවා - ශාක භක්ෂක ලේනා - සර්ව භක්ෂක කටුස්සා, නයා, ඇටිකුකුළා - - මාංශ භක්ෂක
(ලකුණු 03)
iii. ශාක → දළඹුවා → කටුස්සා → ඇටිකුකුළා (ලකුණු 02) iv. ශරීරයේ වර්ණය වෙනස් කිරීම (ලකුණු 01)
v. හරිත ශාක සූර්යය ශක්තිය උදව්වෙන් ආහාර නිපදවන නිසා/ප්‍රභාසංශ්ලේෂණය කරන නිසා (ලකුණු 01)
vi. පරිසරයේ සමතුලිතතාව බිඳවැටීම/මීයා, ගෙම්බා වැනි සතුන් වැඩිවීම (ලකුණු 01)
vii. බල්ලා, බළලා (ලකුණු 02)
(මුළු ලකුණු 11යි)

07. A i. පරිපථ රූප සටහනට (ලකුණු 02) ii. සන්නායක උදාහරණ (ලකුණු 02)
iii. විදුලි ධාරව එක් දිශාවකට පමණක් ගැලීමට සැලැස්වීම (ලකුණු 01)
 සංකේතයට (ලකුණු 01)
iv. ක්‍රියාමාර්ගයට (ලකුණු 01) v. විදුලි අනතුරු වළක්වා ගැනීමට (ලකුණු 01)
B i. කාසිය චලනය වීමෙන් / කාසිය ඉස්සීම (ලකුණු 01)
ii. වැව් සිඳීයාම, ළිංවල ජල මට්ටම පහළ බසියි, පොළොව ඉරිතලා යෑම, උණුසුම, ලැව්ගිනි හට ගැනීම ආදිය
(ලකුණු 02)
(මුළු ලකුණු 11යි)

(2) WWW.PastPapers.WiKi (2)

Download Term Test Papers, Short Notes From One Place!

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න



## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

පෙසුරු Pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**